# Perveniens Ad Excellentiae Anatomiae

**DEPARTMENT OF ANATOMY**

**FACULTY OF MEDICINE**
**UNIVERSITY OF KELANIYA, SRI LANKA**

**P.O. Box 6, Thalagolla Road, Ragama, Sri Lanka**

Tel: (009411)2961124, (009411)2958219, (009411) 2958039 Fax: (009411)2958337

කායව්‍යවච්ඡේද අංශය
වෛද්‍ය පීඨය
කැලණිය විශ්ව විද්‍යාලය

හිතවත් මහත්මයාණෙනි / මහත්මියනි,

**<u>වෛද්‍ය පීඨයට මෘත ශරීර පරිත්‍යාග කිරීම.</u>**

ඔබගේ ශරීරය මරණින් පසු අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා භාරදීමට ඔබ විසින් ගෙන ඇති තීරණය පිළිබඳව ස්තූතිවන්ත වෙමු. මෘත ශරීරයක් වෛද්‍ය පීඨය වෙත භාරදීම සඳහා භාරකරුවන්ගේ එකඟතාවය අවශ්‍ය වන අතර ඔවුන් විසින් අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටි පහත දක්වා ඇත.

1) මෘත ශරීරය භාරදීමේ දිනය සහ වේලාව වෛද්‍ය පීඨ කායව්‍යවච්ඡේද අංශය වෙත පැමිණ හෝ දුරකථනයෙන් අමතා (011 2961163, 011 2961000, 011 2961124, 071 3911396) නියම කරගත යුතුය. මෘත ශරීර භාරගනු ලබන්නේ සතියේ දිනවල (රජයේ නිවාඩු දින හැර) පෙ.ව.10.00 සිට ප.ව.3.00 දක්වා පමණි. සෙනසුරාදා දින පෙ.ව.10.30ට පසු හා ඉරිදා දිනයන්හි මෘත ශරීර භාරගනු නොලැබේ.

2) මෘත ශරීරයක් භාරදීමට පැමිණෙන තැනැත්තා තමාගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කළයුතු අතර මරණ සහතිකයේ මුල් පිටපත හා ඡායාපිටපතක් ද ඉදිරිපත් කළ යුතුවේ.

3) මෘත ශරීරය නිවසින් හෝ භාරකරුවන් වෙතින් අප වෙත භාරදීමට පෙර ඔබ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමා දේහය භාරදීම පිළිබඳව දැනුවත් විය යුතුය. (මරණ සහතිකයේ ඡායාපිටපතක් සහතික කර තිබීම ප්‍රමාණවත් බව කාරුණිකව දන්වමි.)

4) මරණය සිදු වී පැය දොළහක් ඇතුළත භාරදෙනු ලබන්නේ නම්, ස්වාරක්ෂණය (එම්බාම්) කිරීම අනවශ්‍යය. සම්පූර්ණයෙන් ස්වාරක්ෂණය කරන ලද දේහයක් නම්, පැය 48ක් ඇතුලත භාරදිය යුතුය. ස්වාරක්ෂණය කරන්නේ නම්, එය කළ යුත්තේ ශරීරයේ වෙනත් කිසිම අවයවයක් කපා ඉවත් නොකර කලවා පෙදෙසේ ඉහළ කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වාරක්ෂණ තරලය විදීමෙන් පමණි. ඔබ බාර දෙන දේහය වෛද්‍ය පීඨ අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කරන හෙයින් ඒ පිළිබඳව ස්වාරක්ෂණය කරන තැනැත්තාව හොඳින් දැනුවත් කළ යුතුයි.

5) භාරදෙන මෘත දේහය අධ්‍යයන කටයුතු සඳහා සුදුසු තත්වයක නැත්නම් හෝ නරක් වෙමින් පවතින්නේ නම්, එය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වෛද්‍ය පීඨය සතුව ඇති බව කරුණාවෙන් සළකන්න. එවැනි අවස්ථාවක දී දේහය පීඨයෙන් වහාම ඉවත් කර ගැනීමේ වගකීම සමීපතම ඥාතීන් වෙත පැවරෙන බව කරුණාවෙන් සළකන්න.

6) ආගමික වතාවක් නිවසේදීම සිදුකර මෘත දේහය භාරදීමට රැගෙන ආයුතුය. වෛද්‍ය පීඨය තුළ දී ආගමික වතාවත් කිරීමට ඉඩ ලබාදිය නොහැක. මෘත දේහය ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් පීඨය මඟින් නොසපයෙන අතර ආරක්ෂක හේතූන් මත දේහය භාරදීමට වෛද්‍ය පීඨයට ඇතුල්වීමට අවසර දෙනු ලබන්නේ පුද්ගලයන් පස් දෙනෙකුට පමණක් (මල්ශාලා නියෝජිතයින් ඇතුළුව) බව සළකන්න.

7) වයස අවුරුදු 75ට වැඩි හෝ පශ්චාත් මරණ පරීක්ෂණයකට බඳුන් කළ හෝ විශාල ශල්‍යකර්මයකට බඳුන් වූ දේහ භාරගත නොහැක. නමුත් අක්ෂිදාන සංගමයට ඇස් ප්‍රදානය කරනු ලැබූ දේහයන් භාර ගැනීම සිදුකරන බව කරුණාවෙන් සළකන්න.

8) මෘත ශරීර රැගෙන එන පෙට්ටිය සහ අනෙකුත් සැරසිලි වෛද්‍ය පීඨයට භාරගත නොහැකි බවත් දේහය භාරදීමෙන් අනතුරුව ඒවා නැවත රැගෙන යන ලෙසත් මල් ශාලාවට උපදෙස් දෙන මෙන් කරුණාවෙන් දන්වමි.

9) භාරගත් මෘත ශරීර පහත සඳහන් කටයුතු සඳහා යොදාගැනේ. වෛද්‍ය පීඨවල සිසුන්ගේ අධ්‍යයන කටයුතු, වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රදර්ශන, වෛද්‍ය පර්යේෂණ, ප්‍රජා අධ්‍යාපනය සහ පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා.

10) දිගු කාලීන මෘත දේහ තබා ගැනීමට කටයුතු කිරීම හෝ දේහය කොටස් හෝ කොටස් යලි ආපසු ලබාදීම හෝ කල නොහැකි බව කරුණාවෙන් දන්වමි. එමෙන්ම වෛද්‍ය පීඨයට මෘත ශරීරය භාරදුන් දිනයෙන් පසු නැවත ඥාතීන්ට කිසිදු හේතුවක් මත මෘත දේහය නැරඹීමට නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

**අංශ ප්‍රධාන, කායච්ඡේද අංශය**

---

සම්පූර්ණ නම ..........................................................................................................................

ලිපිනය ..........................................................................................................................

**භාරකරු වෙත කරනු ලබන ප්‍රකාශය,**

................................................................ වන (ජා.හැ.අංකය) ....................................................

මාගේ ශරීරය වෛද්‍ය පීඨ සිසුන්ගේ අධ්‍යයන කටයුතු, වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රදර්ශන, වෛද්‍ය පර්යේෂණ, ප්‍රජා අධ්‍යාපනය, වෙනත් වෛද්‍ය පීඨයන්හි අධ්‍යයන කටයුතු සහ පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා කොටස් හෝ කොටස් ලබා ගැනීමට මාගේ මෘත ශරීරය භාරදීමට මෙයින් කැමැත්ත ප්‍රකාශ කරමි.

.........................................
අත්සන

වම් මාපටැඟිලි සලකුණ

දකුණු මාපටැඟිලි සලකුණ

**මෙම පත්‍රිකාව පුරවා ඥාතියකුට ලබාදෙන්න. නැත්නම් පෙනෙන තැනක එල්ලා තබන්න, එය වෛද්‍ය පීඨය වෙත ආපසු එවීම අනවශ්‍යයි.**